ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජූලි 2019

## (AA15) ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය
(Business Operations and Management)

---

**"ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය" විෂය ක්ෂේත්‍රයේ සියලුම අංශ ආවරණය වන පරිදි දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්න පත්‍රයේ අරමුණ විය. එමෙන්ම ප්‍රායෝගික තත්ත්වයක්ද විද්‍යමාන වේ. මෙම පරීක්ෂක වාර්තාවේ ප්‍රධාන අරමුණ වන්නේ කාර්යසාධනය අඩු මට්ටමේ තිබූ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකොට, අයදුම්කරුවන්ගේ අනාගත කාර්යසාධනය ඉහළ නංවාලීමට උපකාර වීමය.**

ඉතාමත් සීමිත පිරිසක් හැරෙන්නට මෙම විභාගයේදී විභාග අයදුම්කරුවන් සාර්ථක ලෙස උත්තර සැපයීමට සමත්වී ඇත. අයදුම්කරුවන් දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුනු දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම කොටසින් ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය සම්පූර්ණ විෂය ආවරණය වී තිබූ අතර, අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය. ලකුණු 100 න් ලකුණු 40 ක් මෙම ප්‍රශ්නයට වෙන් කොට තිබූ අතර, අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු ගණනක් ප්‍රමාණාත්මක ලකුණු ප්‍රමාණයක් ලබා තිබුණි. ප්‍රශ්න අංක 1.4, 1.7, 1.13, 1.15 සහ 1.18 සඳහා අයදුම්කරුවන් බොහොමයක් සාර්ථක උත්තර ලියා තිබුණේ නැත. ඒ ප්‍රශ්න පිළිබඳ නිරීක්ෂණයන් මෙසේය:

1.4 අයදුම්කරුවන්ගෙන් බහුතරය සීමාසහිත පෞද්ගලික සමාගමක සංයුතිය පිළිබඳව දැන සිටියේ නැත. අයදුම්කරුවන් බොහොමයක් නිවැරදි උත්තරය වෙනුවට "මහජනතාවට කොටස් නිකුත් කිරීමට අවසර ඇත" යන්න උත්තරය වශයෙන් ලියා තිබුණි.

1.7 බොහොමයක් අයදුම්කරුවන් රැකියා පිරිවිතරයක් හඳුනාගෙන නොතිබීම නිසා, ඔවුන්ගෙන් බොහොමයක් දී තිබූ වරණයන් අතුරෙන් නිවැරදි උත්තරය දී තිබුණේ නැත.

1.13 පිලිප් කොට්ලර්ට අනුව සාර්ථක සන්නාමයක් ලෙස පිළිගැනීමට අවශ්‍ය ලක්ෂණයන් අයදුම්කරුවන් බොහොමයක් තේරුම්ගෙන තිබුණේ නැත. එමනිසා, පිලිප් කොට්ලර් න්‍යාය ගැන අයදුම්කරුවන් තුළ පැහැදිලි දැනුමක් තිබීම වැදගත්ය.

1.15 අයදුම්කරුවන්ගෙන් බහුතරය පාරිසරික කාර්යසාධනය සඳහා සංවිධානවලට ප්‍රදානය කෙරෙන ගුණත්ව සහතිකය හඳුන්වනු ලබන සංකේතය හඳුනාගෙන නොතිබූ අතර, නිවැරදි උත්තරය වන (4) වෙනුවට, අංක (1) තෝරාගෙන තිබුණි.

1.18 අයදුම්කරුවන් බොහොමයක් බලපත්‍රලාභී වාණිජ බැංකුවට උදාහරණයක් වශයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව තෝරාගෙන තිබුණි.

ස්ව-අධ්‍යයන පාඩම් පොතේ දක්වා ඇති පරිදි ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය ට අදාල මූලික සංකල්ප පිළිබඳ දැනුම අයදුම්කරුවන් වැඩිදියුණු කරගත යුතුය. ඉහත කී නිශ්චිත ප්‍රශ්න හැර, බොහොමයක් අයදුම්කරුවන් හොඳින් උත්තර ලියා තිබුණේය.

## B - කොටස

මෙම කොටසේ එකකට ලකුණු 10 බැගින් ලැබෙන අනිවාර්ය ප්‍රශ්න 4 ක් සඳහා ලකුණු 40 ක් වෙන්කර තිබුණි.

### ප්‍රශ්න අංක **02** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රශ්නය පදනම් වී තිබුණේ **ව්‍යාපාර වර්ග, සන්නිවේදනය සහ ප්‍රවාහන පද්ධති මතය.**

**(a) කොටස** හවුල් ව්‍යාපාරයක ලක්ෂණ පරීක්ෂා කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට සතුටුදායක ලෙස උත්තර සපයා සම්පූර්ණ ලකුණු ලබා තිබුණි. එහෙත්, අයදුම්කරුවන් කිප දෙනෙකු ලක්ෂණ පැහැදිලි කර තිබුණේ නැත.

**(b) කොටස** (i) සන්නිවේදනයේ ගුණාංග පරීක්ෂා කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට සතුටුදායක ලෙස උත්තර ලියා මුළු ලකුණු ලබාගෙන තිබුණි.

(ii) ප්‍රවාහන පද්ධතියක ලක්ෂණ පරීක්ෂා කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට සාර්ථකව උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබා තිබුණි. ලකුණු ලබා ගැනීමට අසමත් වූ අය ප්‍රවාහන මාධ්‍ය ගැන ලියා තිබුණේය. එමනිසා උත්තර ලිවීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කරගත යුතුය.

### ප්‍රශ්න අංක **03** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ව්‍යාපාර සංවිධාන පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදී.

**(a) කොටස** ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ ගැන ලියා අයදුම්කරුවන් බහුතරයක් සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය.

**(b) කොටස** මෙම කොටස පෝටර්ගේ වටිනාකම් දාමය මත පදනම් වී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් පෝටර්ගේ වටිනාකම් ක්‍රියාදාමයේ ප්‍රාථමික ක්‍රියාකාරකම් සහ උපකාරක ක්‍රියාකාරකම් ගැන අබබෝධ කරගෙන තිබුණේ නැත. අයදුම්කරුවන් ඉතා ස්වල්ප දෙනෙකු පමණක් නිවැරදි උත්තර ලියා තිබුණි. සමහර අයදුම්කරුවන් ප්‍රාථමික ක්‍රියාකාරකම් සහ උපකාරක ක්‍රියාකාරකම් ලැයිස්තුගත කර තිබුණද, පැහැදිලි කර තිබුණේ නැත. සමහර අයදුම්කරුවන් ප්‍රාථමික ක්‍රියාකාරකම් වෙනුවට උපකාරක ක්‍රියාකාරකම් ලියා තිබුණේය. මෙයින් පැහැදිලි වන්නේ අයදුම්කරුවන් සංවිධානයක මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ ඔවුන්ගේ දැනුම ශක්තිමත් කරගත යුතු බවය. මෙම ප්‍රශ්නයට උත්තර ලියූ සමහර අයදුම්කරුවන් නොපැහැදිලි උත්තරද ලියා තිබුණි.

### ප්‍රශ්න අංක **04** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය මානව සම්පත් කළමනාකරණය මත පදනම් වී තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

**(a) කොටස** අයදුම්කරුවන්ගෙන් බහුතරය මානව සම්පත් කළමනාකරණයේ කාර්යයන් අවබෝධ කරගෙන තිබූ අතර, සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් ඔවුන්ගේ සාමාන්‍ය දැනීමෙන් ප්‍රශ්නයට උත්තර ලියා තිබූ බව පෙනුණි. අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් මානව සම්පත් කළමනාකරණයේ කාර්යයන් වෙනුවට කළමනාකරණයේ කාර්යයන් ලියා තිබුණේය.

**(b) කොටස** අයදුම්කරුවන්ගෙන් බහුතරය මානව සම්පත් කළමනාකරණයේ කාර්යයන් නිසිලෙස පැහැදිලි කර සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය. සෙසු පිරිස හොඳින් පැහැදිලි නොකොට කෙටි පැහැදිලි කිරීම් ලියා තිබුණි. අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් කළමනාකරණයේ කාර්යයන් පැහැදිලි කර තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

අලෙවිකරණය ගැන අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදි. අයදුම්කරුවන්ගෙන් බහුතරය සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් උපයාගෙන තිබුණේය. ගාල්ලේ පිහිටි "කිඩෝ" නම් වූ ආහාර භෝජනාගාරයක් මත පදනම් වූ විෂය අධ්‍යයනයක් ලෙස යොමුකළ ප්‍රශ්නයකි.

**(a) කොටස** (i) "කිඩෝ" හි අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් මෙයින් පරීක්ෂා කර තිබුණි. දී ඇති සිද්ධියට අදාල කරුණු සැලකිල්ලට ගෙන විචල්‍යයන් පැහැදිලි කිරීමට අපොහොසත් වීම නිසා අයදුම්කරුවන් බොහොමයකට සම්පූර්ණ ලකුණු ලබාගැනීමට නොහැකි විය.

(ii) මෙම කොටසින් "කිඩෝ" හි ආහාරදාමය සඳහා ඉලක්කගත අලෙවිකරණ ප්‍රවේශය පරීක්ෂා කරන ලදි. අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය. ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය තේරුම් නොගැනීමෙන් සහ අලෙවිකරණ ප්‍රවේශයන් පිළිබඳව දැනුවත් බවක් නොමැතිකමින් වෙනස් කරුණු ලියා තිබුණේය.

**(b) කොටස** මෙම කොටස ස්ථානගත කිරීමේ උපායමාර්ගයන් මත පදනම් විය. "ස්ථානගතකිරීම" යන පදය හඳුනාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් අයදුම්කරුවන්ගෙන් බහුතරය නිසිපරිදි උත්තර ලියා නොතිබූ අතර, අඩු ලකුණු ලබාගෙන තිබුණි. අයදුම්කරුවන් බොහොමයක් උත්තර ලියා තිබුණේ ස්ථානගත කිරීම යන්න ස්ථානය / පිහිටීම වශයෙන් ගැනීමෙනි.

## C - කොටස

මෙම කොටස ලකුණු 20 ක සිද්ධි අධ්‍යයනයක් ඇතුලත් අනිවාර්ය ප්‍රශ්නයකින් සමන්විත විය.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

**"ජසී සොෆ්ට්"** නම්වූ ආයතනයක් සම්බන්ධ විෂය සිද්ධි අධ්‍යයන ප්‍රශ්නයක් වූ මෙයින් තොරතුරු කළමනාකරණය සහ ගෝලීයකරණය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදි. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, ඔවුන්ගෙන් බොහොමයක් සාර්ථක ලෙස නිවැරදි උත්තර ලියා සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

**(a) කොටස** අයදුම්කරුවන්ගෙන් බහුතරය **ජසී සොෆ්ට්** ව්‍යාපාරික පරිසරය PEST විශ්ලේෂණය භාවිතකර පැහැදිලි ලෙස තක්සේරු කර තිබූ අතර, ඉහළ ලකුණු ලබාගෙන තිබුණි. එහෙත් සීමිත අයදුම්කරුවන් පිරිසක් දෙන ලද සිද්ධිදාමය සළකා නොබලා PEST විශ්ලේෂණය පැහැදිලි කර තිබුණි.

**(b) කොටස** ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලද්දේ **ජසී සොෆ්ට් ආයතනයේ** SWOT විශ්ලේෂණය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීමය. අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ විෂය හොඳින් අවබෝධකරගෙන තිබුණේය. අපේක්ෂිත උත්තර ඔවුන් සපයා තිබූ අතර, සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය.

**(c) කොටස** හොඳ තොරතුරුවල ලක්ෂණ පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි. අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ නිසිලෙස උත්තර සපයා මුළු ලකුණු ප්‍රමාණයම ලබා තිබුණේය.

**(d) කොටස** **ඊසි සොෆ්ට් ආයතනයේ** ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ මෘදුකාංග (ERP) ගැන මෙම කොටස පදනම් වී තිබුණි. ERP ගැන දුර්වල දැනුම නිසා අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම කොටසට උත්තර ලිවීමට අපොහොසත් විය. අයදුම්කරුවන් ඉතා සුළු ගණනක් සම්පූර්ණ ලකුණු ලබා ගත්තේය.

**(e) කොටස** මෙම ප්‍රශ්නයෙන් විද්‍යුත් වාණිජ්‍යය පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය ගණනක් සාර්ථක ලෙස උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය. අයදුම්කරුවන්ගෙන් බොහොමයක් ප්‍රශ්නය නිසිලෙස අවබෝධ කර නොගෙන උත්තර ලියා තිබූ අතර, විද්‍යුත් වාණිජ්‍යයේ සාර්ථකත්වයට බලපාන ප්‍රධාන සාධක වෙනුවට විද්‍යුත් වාණිජ්‍යයේ බලපෑම පිළිබඳව ලියා ඇත.

- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති දෙයට පමණක් උත්තර ලිවීම. නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකිරීම.

(3) ස්ව-අධ්‍යයන පාඩම් මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

(4) පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීම සහ අවශ්‍ය කුසලතා ගොඩ නගා ගැනීම.

(5) අත් අකුරු කියවිය හැකි ආකාරයටත්, ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කිරීම.

(6) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(7) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කර ගැනීම.

(8) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(9) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(10) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -